# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 30 දරන වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පනත

---

**[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 20 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 සැප්තැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 9.50 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

**2005 අංක 30 දරන වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පනත**

[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 20 වන දින]

එල්. ඩී.–ඕ. 49/2003.

**වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ සාක් සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි**

පූර්විකාව.

වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ සම්මුතියක් දෙදහස් දෙක වසරේ ජනවාරි මාසයේ දී දකුණු ආසියා කලාපීය සහයෝගීතා සංගමය (සාක්) විසින් කත්මන්ඩු නුවර දී සම්මත කර ගනු ලැබූ හෙයින් ද ;

දෙදහස් දෙක වසරේ ජනවාරි මස පස් වන දින ඉහත කී සම්මුතියට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අත්සන් කරුවකු වූ බැවින් ද ;

ඉහත කී සම්මුතියේ විධිවිධාන ශ්‍රී ලංකාවෙහි බලාත්මක කිරීමට නෛතික විධිවිධාන සෑදීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව බැඳී සිටින හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1**. මේ පනත 2005 අංක 30 දරන වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ සම්මුතිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2002 ජනවාරි මස 5 වන දින කත්මන්ඩු නුවර දී අත්සන් කරන ලද (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම සඳහා වූ සම්මුතිය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වන දිනය ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන දිනයක සිට මේ පනත ක්‍රියාත්මක විය යුතු ය.

වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම සම්බන්ධ වැරදි.

**2**. (1) වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීමේ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ වෙනත් කාරණාවක් සඳහා ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් හෝ යම් කොටසක් —

(i) පවත්වාගෙන යන, නඩත්තු කරන හෝ කළමනාකරණය කරන ;

(ii) දැන දැනම මුදල් යොදවන හෝ මුදල් යෙදවීමට සහභාගී වන ; හෝ

(iii) දැන දැනම බද්දට හෝ කුලියට දෙන,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කිරීමට —

(අ) තැත් කරන ;

(ආ) ආධාර කරන හෝ අනුබල දෙන ;

(ඇ) කුමන්ත්‍රණය කරන,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) (අ) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තෙක් අවුරුදු තුනක් නො ඉක්ම වන්නා වූ සහ අවුරුදු පහළොවකට වැඩි නොවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට යටත් විය යුතු ය.

(ආ) වරදේ ස්වභාවය සැලකිල්ලට ගෙන (අ) ඡේදය යටතේ පනවනු ලබන දඩයක ආකාරයෙන් වූ වන්දි මුදලක් වින්දිතයාට ගෙවීම සඳහා අධිකරණය විසින් අයකරනු ලැබිය හැකි ය. එම වන්දි මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් අවුරුදු පහක කාලයක් දක්වා තව දුරටත් දීර්ඝ විය හැකි කාලයකට බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය හැකි ය.

(ඇ) එම වරද නැවත වාරයක් කරනු ලැබූ අවස්ථාවක දී, එම වරද සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති දඬුවම සහ දඩය මෙන් දෙගුණයක් නියම කිරීමෙන් එම වරදකරුට දඬුවම් පමුණුවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "අනුබල දීම" සහ "කුමන්ත්‍රණය කිරීම" යන යෙදුම්වලට පිළිවෙලින් දණ්ඩ නීති සංග්‍රහයේ 100, 101 සහ 113අ යන වගන්තිවල ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

**3**. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ වැරදි අසා, විභාග කොට, දඬුවම් පැමිණවීම සඳහා කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ මහාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව මගින් බස්නාහිර පළාත සඳහා පිහිටුවන ලද කොළඹ දී පවත්වනු ලබන මහාධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු ය. මේ පනත යටතේ වූ වැරදි මහාධිකරණය විසින් විභාග කළ යුතු බව.

(2) මේ පනත යටතේ වූ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරනු ලැබූ අවස්ථාවක,—

(අ) ඒ ක්‍රියාව සිදු කළ තැනැත්තා ශ්‍රී ලංකාවේ සිටී නම් ;

(ආ) එම වරද සිදු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් නම් හෝ ශ්‍රී ලංකාවේ නිතර වාසය කරන අදේශික තැනැත්තකු නම් ; හෝ

(ඇ) වරද සිදු කරනු ලැබූ බවට උද්දේශිත තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම්,

එම වරද ශ්‍රී ලංකාවේ දී සිදු කරන ලද වරදක් ලෙස සලකා විභාග කිරීමට (1) වන උපවගන්තියේ සඳහන් මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

4. (අ) 2 වන වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති යටතේ වරදක් සිදුකරන ලද අවස්ථාවක (මෙහි මින් මතු "වරදකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු - බරපතල අවස්ථානුගත කරුණු.

(i) කාන්තාවන් සහ ළමයින් ජවාරම් කිරීම හා සම්බන්ධ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයෙක් වන හෝ ඊට සම්බන්ධවන ;

(ii) වෙනත් ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ කටයුතු වලට සම්බන්ධ වී සිටින ;

(iii) වරදක් සිදු කිරීමේ දී ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කර ඇති හෝ අවි ආයුධ භාවිත කර ඇති ;

(iv) රජයේ නිලයක් දරන අතරම එමගින් එම ධුරයේ බලතල සහ අධිකාරි බලය සම්පූර්ණයෙන්ම අනිසි ලෙස භාවිත කරන ;

(v) ළමයින්ට හිරිහැර කිරීමේ හෝ ළමයින් ජාවාරම් කිරීමේ නියැළී ඇති ; සහ

(vi) විශේෂයෙන්ම සමාන වැරදිවලට කලින් වැරදිකරුවකු වී සිටින, හෝ

(ආ) භාරකාර ආයතනයක දී හෝ අධ්‍යාපන ආයතනයක දී හෝ සමාජයට පහසුකම් සලසන ස්ථානයක දී හෝ ඒවාට ඉතා ආසන්න ස්ථානයක දී හෝ අධ්‍යාපන, ක්‍රීඩා, සමාජ කටයුතු සහ සංස්කෘතික කටයුතු සඳහා ළමයින් සහ ශිෂ්‍යයන් පැමිණෙන වෙනත් ස්ථානයක දී,

2 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් වැරදි සම්බන්ධයෙන් සිදු කරන ලද වරදෙහි බරපතල ස්වභාවය සැලකිල්ලට ගෙන ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී මහාධිකරණය විසින් එම කරුණු සැලකිල්ලට ගත යුතු ය.

මේ පනත යටතේ සඳහන් වැරදි සම්බන්ධයෙන් සිරභාරයට ගනු ලැබූ ඇතැම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

**5**. ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු මේ පනත යටතේ වූ වරදක් සඳහා සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක—

(අ) තමා පුරවැසියකු වන රාජ්‍යයේ හෝ තම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අන්‍යාකාරයකින් හිමිකම් ඇති රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමග නැතහොත් ඒ තැනැත්තා අදේශික තැනැත්තකු නම් ඔහු නිතර වාසය කරන ප්‍රදේශය අයත් රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමග අප්‍රමාදව සන්නිවේදන කර ගැනීමට ; සහ

(ආ) ඒ රාජ්‍යයේ නියෝජිතයකුට තමන් දැකීමට,

අවස්ථාව ලබා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත සංශෝධනය කිරීම.

**6**. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(47) 2005 අංක 30 දරන වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ සාක් සම්මුතිය පනත මගින් ආවරණය වන වරදක්."

7. මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සමග යම් සම්මුතියට අයත් රාජ්‍යයක් විසින් සාදන ලද උදර්පණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මකව ඇති අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්යය සඳහා එම වැඩ පිළිවෙලට, මේ පනතේ උපලේඛනයේ සඳහන් වැරදි සම්බන්ධයෙන් උදර්පණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ද ඇතුළත් කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

සම්මුතියට අයත් රාජ්‍යයන් සමග දැනට පවත්නා උදර්පණ වැඩ පිළිවෙලවල් මගින් උපලේඛනයේ සඳහන් වැරදි සඳහා විධිවිධාන සලස්වනු ලබන බවට සලකනු ලැබිය යුතු බව.

8. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ සම්මුතියට අයත් යම් රාජ්‍යයක් අතර උදර්පණ වැඩ පිළිවෙලක් නොමැති අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්ය සඳහා මේ පනතේ උපලේඛනයේ සඳහන් වැරදි සම්බන්ධයෙන් උදර්පණය කිරීම සඳහා විධිවිධාන සලස්වමින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ සම්මුතියට අයත් රාජ්‍ය විසින් සාදන ලද උදර්පණ වැඩ පිළිවෙලක් ලෙස, මෙම සම්මුතිය සලකනු ලැබිය හැකි ය.

උපලේඛනයේ සඳහන් වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ඇතැම් රාජ්‍ය අතර උදර්පණ වැඩපිළිවෙලක් ලෙස අමාත්‍යවරයා විසින් මේ සම්මුතිය සලකනු ලැබිය හැකි බව.

9. මේ පනතේ උපලේඛනයේ විස්තර කර ඇති වරදකට චෝදනා ලැබ ඇති හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උදර්පණය කිරීම සඳහා සම්මුතියට අයත් රාජ්‍යයක ආණ්ඩුවක් විසින් හෝ එම ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක, එම වරද සඳහා එම තැනැත්තාට එරෙහිව නඩු පැවරීම සඳහා හෝ ඔහු උදර්පණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජිත පියවර පිළිබඳව ඉල්ලා සිටින රාජ්‍යයේ ආණ්ඩුව වෙත ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා විසින් වහාම දැනුම් දිය යුතු ය.

ඉල්ලීමක් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තන්ගේ උදර්පණය සඳහා ද එම තැනැත්තන්ට එරෙහිව ගෙන ඇති පියවර පිළිබඳව ඉල්ලා සිටින රාජ්‍යයට දැනුම් දීමට අමාත්‍යවරයාට ඇති කාර්ය භාරය.

10. (1) මේ පනතේ 2 වන වගන්තිය යටතේ යම් වරදක් පිළිබඳව විමර්ශනය සහ නඩු පැවරීම සඳහා අවශ්‍යා වන කවර හෝ අවස්ථාවක, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කර ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් හෝ ඉහත කී පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වූ පොදු රාජ්‍ය මණ්ඩලීය නොවන රටවල් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හා වෙනත් රාජ්‍යයන්ට සහය ලබා දීම සම්බන්ධයෙන්, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

සම්මුතියට අයත් රාජ්‍යයන්ට සහාය දීම.

(2) ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කර ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් හෝ ඉහත කී පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නොවන්නා වූ වෙනත් රටක් සම්බන්ධයෙන් වන විට, (සාක්ෂි සහ ප්‍රකාශ ලබා ගැනීමට ඇණවුම් කර භාර දීමට සහ සෝදිසි කිරීම් සිදු කිරීමට අදාළ සහාය ඇතුළු) 2 වන වගන්තිය යටතේ වරදක් විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු සහාය සාක් සම්මුතිය යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට යම් සම්මුතියකට අයත් රාජ්‍යයකට ලබා දීම ආණ්ඩුවේ කාර්ය වන අතර, ආණ්ඩුව විසින් අමාත්‍යවරයා මගින් එවැනි සියලු සහාය එවැනි සම්මුතියකට අයත් රාජ්‍යයකින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) සම්මුතියකට අයත් රාජ්‍යයකට සහාය ලබා දීම, අමාත්‍යවරයා විසින් සුදුසු යයි සලකනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව සිදු විය යුතු ය.

*අමාත්‍යවරයා විසින් විධාන නිකුත් කළ හැකි බව.*

**11.** (1) මේ පනතේ ඇතුළත් කර ඇති පරිදි සම්මුතියේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) තත් කාර්ය සඳහා යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද ආයතනයන්හි අවශ්‍ය අවස්ථාවන්හි දී ජාවාරම් කරනු ලැබූ වින්දිතයන්ට නවාතැන් පහසුකම් සහ ආවරණය සහ වෙනත් පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය විය හැකි විධිවිධාන අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය යුතු ය.

*ජාවාරම් කිරීමට එරෙහිව කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් අතිරේක පියවර ගනු ලැබිය හැකි බව.*

**12.** අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සඳහා අවශ්‍ය විය හැකි පියවර ගනු ලැබිය යුතු අතර, කලින් කල එවැනි කරුණු සඳහා අවශ්‍ය විය හැකි විධාන නිකුත් කරනු ලැබිය යුතු ය—

(අ) නීතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන සහ අධිකරණය අතර, සම්මුතිය යටතේ වූ වැරදි සම්බන්ධයෙන් දැනුවත් කිරීම ;

(ආ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා පිහිටුවනු ලැබිය හැකි යම් ප්‍රාදේශීය කාර්ය බලකායකට යම් නිලධරයන් පත් කිරීම ;

(ඇ) කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රභවයන් සහ ගමන් කිරීමේ විවිධ ක්‍රම අනුගමනය කිරීම හරහා ඔවුන්ගේ ක්‍රියා පිළිවෙලවල් පිළිබඳව තොරතුරු බෙදා ගැනීම, (මේ ඡේදයේ තොරතුරු යන්නට විමර්ශනය අතරතුර දී වාර්තාගත කරන ලද විශේෂ විස්තර ද ඇතුළත් වේ.) ;

(ඈ) කාන්තාවන් සහ ළමයින් සඳහා රැකියා ලබා දීමේ මුවාවෙන් ඔවුන් ජාවාරම් කිරීම වැළැක්වීම සඳහා විදේශ රැකියා ලබා දීමේ නියැලී සිටින ආයතනවල කටයුතු නියාමනය කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ඉ) කාන්තාවන් පිළිබඳ වැරදි ප්‍රතිරූපයක් ගොඩනැගීම ඇතුළු කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීමේ ප්‍රශ්නය හා එහි විශේෂිත හේතු පිළිබඳව මාධ්‍යය තුළින් ප්‍රචාරය ලබා දීම හෝ වෙනත් ක්‍රියා මාර්ග මගින් ප්‍රසිද්ධියට පත් කිරීම මගින් හෝ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) ජාවාරම් කිරීම සඳහා ප්‍රභවයන් වශයෙන් ප්‍රකට ස්ථානවල දී එසේ ජාවාරම් කිරීම වැළැක්වීම සඳහා සහ ගනු ලබන උත්සාහයන් වැඩි දියුණු කිරීමට අවශ්‍ය වෙනත් පියවර ගැනීම ;

(උ) දේශසීමා හරහා ජාවාරම් කරනු ලබන වින්දිතයන් බවට පත් වූ කාන්තාවන් සහ ළමයින් නැවත සිය රටවලට පැමිණවීම සඳහා පියවර ගැනීම සඳහා සහ අවශ්‍ය අවස්ථාවන්හි දී නීති උපදෙස් සහ සෞඛ්‍ය පහසුකම් සපයා දීම ;

(ඌ) ජාවාරම් කරනු ලැබූ වින්දිතයන්ට ආවරණය සහ පුනරුත්ථාපනය සඳහා සිය ඕනෑකමින් ම හෝ රාජ්‍ය නොවන සංවිධානවල ආධාර ඇතිව ස්ථාන හෝ ආයතන පිහිටුවීම ;

(එ) වින්දිතයන්ට උපදෙස් දීම සහ රැකියා පුහුණුව ලබා දීම සඳහා සෑම උත්සාහයක්ම දැරීම.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

අර්ථ නිරූපණය.

**14**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු 18 ට එළඹ නොවුන තැනැත්තකු අදහස් වේ.

"ජාවාරම් කරනු ලැබූ තැනැත්තන්" යන්නෙන්, ජාවාරම් කරන්නවුන් විසින් රැවටීමෙන්, තර්ජනය කිරීමෙන්, බල කිරීමෙන්, අපහරණය කිරීමෙන්, විකිණීමෙන්, වංචනික විවාහ මගින් හෝ වෙනත් නීති විරෝධී ක්‍රියා මගින් හිරිහැර කිරීමට හෝ වෛශ්‍යා වෘත්තීයට බලහත්කාරයෙන් යොදවන ලද කාන්තාවන් සහ ළමයින් අදහස් වේ.

"වෛශ්‍යා වෘත්තීය" යන්නෙන්, වානිජ පරමාර්ථ සඳහා තැනැත්තන් ලිංගික අපයෝජනයෙහි යෙදවීම, අනිසි ලෙස ප්‍රයෝජනය ගැනීම අදහස් වේ.

"නැවත සිය රටවලට පැමිණීම" යන්නෙන්, ජාවාරම් කරනු ලැබූ වින්දිතයන් ජාත්‍යන්තර දේශ සීමාවන් හරහා මුල් රට වෙත නැවත පැමිණීම අදහස් වේ.

"ජාවාරම්කරුවන්" යන්නෙන්, කාන්තාවන් සහ ළමයින් යම් ආකාරයකින් ජාවාරම් කිරීමේ නියැළී සිටින යම් තැනැත්තකු, නියෝජිත ආයතනයක් හෝ ආයතනයන් අදහස් වේ.

"ජාවාරම් කිරීම" යන්නෙන්, අදාළ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව මුල්‍ය හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් රටක් තුළ හෝ ඉන් පිටත වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ළමයින් ගෙන යාම, විකිණීම හෝ මිල දී ගැනීම අදහස් වේ.

## උපලේඛනය

[7, 8, 9 වගන්ති]

(අ) කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම සඳහා භාවිත කිරීමට යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් හෝ එහි කොටසක් පවත්වාගෙන යාම, නඩත්තු කිරීම හෝ කළමනාකරණය කිරීම;

(ආ) කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම සඳහා භාවිත කිරීමට යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් හෝ එහි කොටසක් භාවිත කිරීම සඳහා දැන දැනම මුදල් යෙදවීම ;

(ඇ) කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම සඳහා භාවිත කිරීමට යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් හෝ යම් කොටසක් සඳහා මුදල් යෙදවීමට සහභාගී වීම ;

(ඈ) කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම සඳහා භාවිත කිරීමට යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් හෝ එහි කොටසක් දැන දැනම බදු දීම හෝ කුලියට දීම ;

(ඉ) (අ) සිට (ඈ) දක්වා වූ ඡේදවල සඳහන් වැරදිවලින් යම් වරදක් සිදුකිරීමට තැත් කිරීම ;

(ඊ) (අ) සිට (ඈ) දක්වා වූ ඡේදවල සඳහාන් වැරදිවලින් යම් වරදක් සිදුකිරීමෙහි ලා ආධාර හා අනුබල දීම ;

(උ) (අ) සිට (ඈ) දක්වා වූ ඡේදවල සඳහන් වැරදිවලින් යම් වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.